උ.ප.රා.සේ.කො.ස.චක්‍රලේඛ අංක 20/2022

මගේ අංකය : NP/07/CMA/15

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

උතුරු පළාත

2022.07.20

ප්‍රධාන ලේකම්,

ආණ්ඩකාරවර ලේකම්,

අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානින්,

සියළුම නිලධාරින් වෙත.

**අන්තර් පළාත් ස්ථාන මාරු සම්බන්ධයෙන් සියළුම පළාත් වලට අදාලව පොදු පටිපාටියක් යටතේ ක්‍රියා කිරීම**

උතුරු පළාත් රාජ්‍ය සේවයෙහි විවිධ තනතුරු සඳහා පත්වීම් ලබන්නන් තම අවශ්‍යතාවයන් සඳහන් කොට වෙනත් පළාත් වලට ස්ථානමාරුවීම් සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කරති. මෙම ඉල්ලීම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලා අඛණ්ඩ ක්‍රියාවලිය සඳහා අන්තර්ගත කරනු ලැබේ.

අන්තර් පළාත් ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් 2021.09.22 වන දින පැවැත්වූ පළාත් ආණ්ඩුකාරවරුන්ගේ සාකච්ඡාවේදී සියළුම පළාත් ආණ්ඩුකාරවරුන්ගේ එකගතාවය මත තීරණය කරන ලද පොදු කොන්දේසින් යටතේ පහත සඳහන් පළාත් සභාවන් තම පළාතට ස්ථාන මාරුවීමට මනාප නිලධාරින් තම ස්ථානමාරු අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන සම්බන්ධ ලැයිස්තමක් නිකුත් කර ඇත.

1. වයඹ පළාත
2. දකුණු පළාත
3. උතුරු මැද පළාත
4. බස්නාහිර පළාත
5. ඌව පළාත
6. සබරගමුව පළාත
7. මධ්‍යම පළාත

උක්ත පළාත් සභාවන් මගින් නිකුත් කළ ස්ථානමාරු අයදුම්පත්‍රය සමග යොමු කළ යුතු ලිපි ලේඛන සම්බන්ධයෙන් වූ ලැයිස්තුවේ ඇමුණුම මේ සමග අමුණා ඇත.

එමෙන්ම ඉහත පළාත් සභාවන් වල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා විසින් නිතුත් කරන ලද අන්තර් පළාත් ස්ථාන මාරු සම්බන්ධයෙන් වූ කොන්දේසින් ඇතුලත් චක්‍රලේඛ හා මධ්‍යම රජයේ අමාත්‍යාංශ විසින් මධ්‍යම/පළාත් රාජ්‍යයන් අතර ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛ ද ඔබගේ පහසු කටයුතු සඳහා උතුරු පළාත් සභාවේ අන්තර්ජාලයේ (www.np.gov.lk) බාගත කර ඇත.

එසේ හෙයින් ඉදිරි කාලවලදී නියමිත පළාත්වලට ස්ථාන මාරුවීම් අයදුම් කරන විට එම අයදුම්පත්‍ර සමග අදාල ලිපි ලේඛනද අමුණා එවන ලෙස ඉල්ලා සිටිමි.

යොමු කළ යුතු බවට නියම කර ඇති සම්පූර්ණ ලිපි ලේඛන සමග යොමු නොකරන අයදුම්පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සැලකිල්ලට ගෙන කටයුතු නොකරන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

***සී. තිරුවාකරන්***
ලේකම්.

## උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා අයදුම් කිරීමේදී අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන

(ස්ථාන මාරු අයදුම්පත්‍රය සමග මෙම නිවරද්‍යතා ලැයිස්තුව ද සම්පූර්ණ කර මේ සමග අමුණා යොමු කළ යුතුයි)

| | අවශ්‍ය ලිපි ලේඛණ | උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු පිටපත් / පිටපත් සංඛ්‍යාව | ඇමුණුම් ඇත / නැත |
|---|---|---|---|
| 01 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/91 යටතේ ස්ථාන මාරු අයදුම්පත්‍රය | මුල්පිටපත් දෙකක් | |
| 02 | නිලධාරියාගේ ස්ථිර පත්වීම් ලිපියේ සහතික කරන ලද පිටපත | සහතික කරන ලද ඡායා පිටපත් - 02 | |
| 03 | ස්ථානමාරු අයදුම් කරන පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු බව සනාථ කළ ග්‍රාම නිලධාරියාගේ සහතිකය (DS 04) | මුල් පිටපත හා ඡායා පිටපත | |
| 04 | අන්තර් පළාත් ස්ථානමාරුව ලබාගත් පසු ස්ථානමාරුව ලැබූ පළාතේ අවුරුදු 05ක් සේවය කිරීම හා නියමිත පළාතේ පුරප්පාඩු පවතින ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට මනාපය පළ කරන ලිපිය | මුල් පිටපත හා ඡායා පිටපත | |
| 05 | සේවය ස්ථිර කරන ලද ලිපිය (පත්වීම ස්ථිර කළ ලිපිය) | සහතික කරන ලද පිටපත් - 02 | |
| | සේවය ස්ථිර කර නැතිනම් පළාත් රාජ්‍ය සේවයට අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටිය අනුව අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති බවට සනාථ කරන, විභාග කොමසාරිස්වරයා /විශ්වවිද්‍යාල රෙජිස්ට්‍රාර්/අදාල ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද පහත සඳහන් ලේඛණ.<br>- අ.පො.ස (සා/පෙ) හා අ.පො.ස (උ/පෙ) විභාග ප්‍රතිඵල ලේඛන<br>- උපාධි සහතිකය / අධ්‍යාපන විද්‍යාපීඨ සහතිකය/ පුහුණු සහතිකය/ ඩිප්ලෝමා සහතිකය සනාථ කරන ලද පිටපත.<br>වැඩ භාරගත් ලිපියේ පිටපත | සහතික කරන ලද පිටපත් අමුණා තිබිය යුතුයි. | |
| 06 | **බස්නාහිර පළාතේ ස්ථානමාරුව හා සම්බන්ධව :**<br>පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලැබූ නිලධාරියා නියමිත තනතුරේ අදාල ශ්‍රේණියේ සේවා ජ්‍යෙෂ්ඨතා ලැයිස්තුවේ අගට තැබීමේ කොන්දේසීන්ට යටත්ව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමට මනාපය දැන්වූ ලිපියක්. | මුල් පිටපත හා ඡායාපිටපතක් | |

| | | | |
|---|---|---|---|
| | **බස්නාහිර පලාත හැර අනෙක් පලාත් සඳහා ස්ථානමාරු හා සබැඳිව:**<br>පලාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලැබූ නිලධාරියා නියමිත තනතුරේ අදාල ශ්‍රේණියේ සේවා ජ්‍යෙෂ්ඨතා ලැයිස්තුවේ අගට තැබීමේ කොන්දේසීන්ට යටත්ව පලාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමට මනාපය දැන්වූ ලිපියක්.<br>**(මධ්‍යම රජය මගින් බඳවා ගෙන පලාත් සභාවන්ට අනුයුක්ත කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් සේවා ජ්‍යෙෂ්ඨතා ලැයිස්තුවේ අගට තැබීමේ කොන්දේසින් අදාල නොවේ)** | | |
| 07 | ස්ථාන මාරුව සඳහා අයදුම් කරන දිනට ප්‍රථම වසර තුනක් (03) (පවත්නා වර්ෂය ඇතුළුව) වැටුප් රහිත නිවාඩු ලබා ඇත / ලබා නැත යනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිර්දේශිත වාර්තාව | මුල් පිටපත් - 02ක් | |
| .08 | නිලධාරියාට විරුද්ධව විනය කටයුතු පවතින බව/ නැතිබව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ වාර්තාව | මුල් පිටපත් - 02ක් | |
| 09 | අදාල පලාත් සභාවේ නිලධාරියාගේ සේවා කාලය තුළ ඒ හා සම්බන්ධ කිසියම් හේතුවක් නිසා එම නිලධාරියාට විරුද්ධව අධිකරණ කටයුතු කිසිවක් සිදු නොකළ බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව | මුල් පිටපත් - 02ක් | |
| 10 | නිලධාරියාට විරුද්ධව බරපතල මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ විගණන පරීක්ෂණයක් තිබේ / නැත යන කරුණු ඇතුලත් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කරන ලද වාර්තාව | මුල් පිටපත් - 02ක් | |
| 11 | අදාල නිලධාරියා නිලධාරියා පලාත් සභාවේ වියදමින් විශේෂ පුහුණුවක් ලබා තිබේ නම් පුහුණුවට අදාල ගිවිසුමේ අනිවාර්ය සේවා කාලය අවසන් කර තිබීම හෝ කිසියම් බැඳුම්කරයකට යටත්වී ඇත්නම් එයින් නිදහස් කර ඇත / නැත යන කරුණු පිලිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව. | මුල් පිටපත් - 02ක් | |
| 12 | ස්ථාන මාරුව අයදුම් කරන අයදුම්කරුගෙන් වත්මන් සේවා ස්ථානයෙන් අයවිය යුතු ණය ශේෂය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව. | මුල් පිටපත් - 02ක් | |